(50)

ED/01/101/06/3/1
ගණිත ශාඛාව
අධ්‍යාපන අමාත්‍යාංශය
ඉසුරුපාය
බත්තරමුල්ල.
2013.05. 21

චක්‍රලේඛ අංකය - 22 / 2013

**සියලුම** පළාත් අධ්‍යාපන ලේකම්වරුන්,
පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
අධ්‍යාපන අධ්‍යක්ෂ (ගණිත),
පළාත්/කලාප ගණිත විෂය භාර නියෝජ්‍ය/ සහකාර අධ්‍යක්ෂවරුන්,
ගණිත ගුරු උපදේශකවරුන් සහ
විදුහල්පතිවරුන් වෙත,

# වාර්ෂික ජාතික ගණිත තරගාවලිය

සෑම වසරක දී ම අධ්‍යාපන අමාත්‍යාංශයේ ගණිත ශාඛාවේ මූලිකත්වයෙන් ජාතික ගණිත තරගාවලියක් පැවැත්වීමට තීරණය කරනු ලැබ ඇත. ඊට අදාළ ජාතික ගණිත **දැනුම මිනුම** තරගාවලියේ සහ ජාතික ගණිත නාට්‍ය තරගාවලියේ **ජාතික මට්ටමේ තරග පවත්වන ආකාරයත්** කලාප සහ පළාත් මට්ටමේ තරග පැවැත්වීමෙන් අනතුරුව එක් එක් තරග ඉසව් සඳහා පළාත නියෝජනය කරන සිසුන් කණ්ඩායම් ඊට සහභාගි කරවිය යුතු ආකාරයත් පිළිබඳ මෙම චක්‍රලේඛයෙන් දැනුවත් කෙරේ.

## 1.0 ජාතික ගණිත තරගාවලිය හැඳින්වීම

දිවයිනේ සියලු ම පාසල්වල ගණිත විෂයය හදාරන ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ දැනුම සහ කුසලතා සංවර්ධනය සඳහාත්, ඔවුන්ගේ ප්‍රායෝගික හැකියා ප්‍රදර්ශනය සඳහාත් ගණිත දැනුම මිනුම තරගමාලාවක් සහ ගණිත නාට්‍ය තරගමාලාවක් වශයෙන් මෙම තරගාවලිය අධ්‍යාපන අමාත්‍යාංශයේ ගණිත ශාඛාව විසින් 2011 වසරේ සිට මේ දක්වා සංවිධානය කර පවත්වනු ලබයි. මෙහි දී එක් වසරක දී සිසුන් 1000කට අධික සංඛ්‍යාවක් තම ප්‍රතිභාවන් ප්‍රදර්ශනය කරන අතර අදාළ ගුරුවරුන් තම නිර්මාණ කුසලතා වර්ධනය සඳහා මනා වූ පිටුවහලක් ද ලබා ගනී. ජාතික ගණිත නාට්‍ය තරගාවලියේ ජයග්‍රහණ ලබා ගන්නා නාට්‍ය ජාතික රූපවාහිනියේ විකාශය කිරීම නිසා එම නාට්‍ය නැරඹීම මඟින් පාසල් දරුවන් සතුටින් ගණිතය ඉගෙනීමට පෙළඹවීමටත්, සිසුන් අතර ගණිතය ජනප්‍රිය කරවීමටත් හැකි වී තිබේ. වසරින් වසරට නව ක්‍රමෝපායන් උපයෝගී කර ගනිමින් පවත්වනු ලබන මෙම තරගාවලිය නිසා ගණිතය සංකීර්ණය, ගැඹුරුය, නීරසය, වටහාගැනීම අපහසුය ආදී වශයෙන් සිසුන් තුළ ඇති ආකල්ප වෙනස් කර ගණිතයේ සරල බව, සෞන්දර්යාත්මක බව, රසවත් බව ඉස්මතු කරමින් පාසලේ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය වඩා අර්ථවත් කළ හැකිව තිබේ. විශේෂයෙන් ම සෙමෙන් ඉගෙන ගන්නා සිසුන් අතර ගණිතය ප්‍රියජනක විෂයයක් බවට පත්කිරීමටත් මේ නිසා හැකි වී තිබේ. තව ද ගුරුභවතුන් අතර සහයෝගීතාවය සහ සුහදතාව සංවර්ධනය කරන තරගාවලියක් බවට ද පත් වී ඇත. ජය පරාජය සමසේ බෙදා ගැනීම වැනි යහපත් මානුෂික ගුණාංග සංවර්ධනය කරනු ලබන මෙම තරගාවලිය පහත සඳහන් අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා වාර්ෂිකව පැවැත්වීමට තීරණය කර ඇත.

## 1.1 ජාතික ගණිත තරගාවලියේ පොදු අරමුණු

1. ගණිතය නීරස යැයි සිසුන් තුළ ඇති ආකල්පය ඉවත් කර ගණිතය ප්‍රියජනක විෂයයක් කරවීම.
2. සෙමෙන් ඉගෙන ගන්නා සිසුන්ට සතුටින් ගණිතය ඉගෙනීමට අවස්ථා සැලසීම.
3. සාම්ප්‍රදායික ගණිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියෙන් බැහැර වී විවිධ අධ්‍යයන අවස්ථා හඳුන්වා දීම සහ ඒවා මතු පරපුරට පවරා දීම.
4. සිසුන්ගේ සුසමාහිත පෞරුෂ වර්ධනය සඳහා විඥාන වර්ධනය, රසඥතා වර්ධනය, මනා ආකල්ප වර්ධනය, කුසලතා වර්ධනය සහ නිර්මාණාත්මක චින්තන වර්ධනය ගණිතය විෂයය ආශ්‍රයෙන් සිදු කිරීම.
5. සියලුම සිසුන්ට විෂයය පරිබාහිරව ගණිත විෂයය සංවර්ධනය සඳහා යොමු වීමේ විකල්ප අවකාශ සැලසීම සහ ජය පරාජය උපේක්ෂා සහගතව විඳදරා ගැනීමට සිසුන් හුරු කරවීම.

2 පිටුවට

## 2.0 ජාතික ගණිත තරගාවලිය පිළිබඳ විස්තර සහ පොදු නීතිරීති

ජාතික ගණිත තරගාවලි මාලාව, ජාතික ගණිත දැනුම මිනුම තරගාවලිය සහ ජාතික ගණිත නාට්‍ය තරගාවලිය යන තරගාවලි දෙකකින් සමන්විත ය. ජාතික ගණිත දැනුම මිනුම තරගාවලිය පිළිබඳව අංක 2.2 යටතේ සහ ජාතික ගණිත නාට්‍ය තරගාවලිය පිළිබඳව අංක 2.3 යටතේ විස්තර වන අතර තරගාවලි දෙකට ම අදාළ පොදු උපදෙස් අංක 2.1 මගින් ඉදිරිපත් කෙරේ.

අදාළ ජාතික ගණිත තරගාවලි පැවැත්වෙන ස්ථාන සහ දින පිළිබඳව අධ්‍යාපන අමාත්‍යාංශයේ ගණිත ශාඛාව විසින් තීරණය කරනු ලැබේ. චක්‍රලේඛයේ සඳහන් කරුණු සංශෝධනයක් සිදුවන්නේ නම් ඒ පිළිබඳව වසර ආරම්භයේ දී ම තීරණය කර දැනුම් දෙන අතර ඊට අදාළ විස්තර සහ උපදෙස් ජාතික තරග ආරම්භ කරන දිනට සිව් මසකට පෙර නිවේදනය කෙරේ.

## 2.1 පොදු උපදෙස්

- ජාතික ගණිත දැනුම මිනුම තරගාවලිය සඳහා සිංහල සහ දෙමළ භාෂා මාධ්‍ය වෙන් කිරීමකින් තොරව කණිෂ්ඨ සහ ජ්‍යෙෂ්ඨ ඉසව් දෙක යටතේ එක් ඉසව්වකින් කණ්ඩායම බැගින් පළාතකින් කණ්ඩායම් දෙකක් ඉදිරිපත් කළ හැකි ය. මීට අමතරව ජාතික ගණිත නාට්‍ය තරගාවලිය සඳහා කණිෂ්ඨ සහ ජ්‍යෙෂ්ඨ යන ඉසව් දෙක යටතේ ද, සිංහල සහ දෙමළ මාධ්‍ය යටතේ ද නාට්‍ය බැගින් වන සේ එක් පළාතකින් නාට්‍ය කණ්ඩායම් 4ක් ඉදිරිපත් කළ හැකි ය. .

- ජාතික මට්ටමට ඉදිරිපත් කරන කණ්ඩායම් තෝරා ගැනීම සඳහා අදාළ පළාත තුළ මෙම තරගාවලියේ පොදු අරමුණු හා එක් එක් තරගාවලිය යටතේ වන සුවිශේෂී අරමුණුවලට ගැළපෙන පරිදි කලාප මට්ටමින් සහ පළාත් මට්ටමින් තරග සංවිධානය කළ යුතු ය. ඒ සඳහා කලාප මට්ටමේ තරග පළමුව පවත්වා ඉන් ජයග්‍රහණය ලබන කණ්ඩායම් පළාත් මට්ටමේ තරගය සඳහා ඉදිරිපත් කළ යුතු ය.

- මීට අදාළ සියලුම කලාප සහ පළාත් තරගාවලි පළාත් ගණිත විෂයය සම්බන්ධීකරණ නිලධාරි විසින් සංවිධානය කළ යුතු අතර තරගාවලියේ පොදු අරමුණු සාක්ශාත් කරගැනීම පිණිස කලාපයේ උපරිම පාසල් සංඛ්‍යාවක් තරගාවලියට ඉදිරිපත් කිරීමට කලාප ගණිත විෂයය භාර නිලධාරි ක්‍රියා කළ යුතු ය. එලෙස කලාපය විසින් හඳුනාගන්නා ලද පාසල්වල තරග කණ්ඩායම් පුහුණු කර ඉදිරිපත් කිරීමේ පූර්ණ වගකීම පාසල්වල විදුහල්පති වෙත පැවරෙන අතර ඊට අදාළ උපදේශනය ගණිත ගුරු උපදේශකවරුන් සැපයිය යුතු ය.

- කලාප තරග කලාප අධ්‍යාපන අධ්‍යක්ෂගේ සහ පළාත් තරග පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂගේ පූර්ණ අධීක්ෂණය යටතේ අධ්‍යාපන අමාත්‍යාංශය මගින් නියම කර ඇති කාලසටහනට අදාළ කාල සීමාව තුළ දී පවත්වා අවසන් කළ යුතු ය.

- කලාප මට්ටමේ සහ පළාත් මට්ටමේ සියලුම තරග ප්‍රතිඵල එම තරග පවත්වනු ලබන දිනයන්හි දී ම නිකුත් කළ යුතු ය. මෙහි දී විනිශ්චය මණ්ඩලය දෙනු ලබන තීරණ කිසිදු ආකාරයකින් වෙනස් නොකළ යුතු ය. එක් එක් තරගාවලිය යටතේ විස්තර කෙරෙන ආකාරයට අනුව ඒ ඒ තරග සඳහා විනිශ්චය මණ්ඩලය තෝරා ගැනීම සිදු කළ යුතු ය.

- ලබාගත් සමස්ථ ප්‍රතිඵල ලේඛනය සමග එක් එක් තරගාවලි සඳහා ප්‍රථම ස්ථාන ලබාගත් කණ්ඩායම් පිළිබඳ විස්තර පාසලේ නම, ලිපිනය, කලාපය, පළාත පැහැදිලිව ලියා කලාප තරග අවසානයේ දී කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ මගින් පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත යැවිය යුතු ය.

- පළාත් තරග අවසානයේ දී ජාතික තරගය සඳහා සහභාගී වන කණ්ඩායම් පිළිබඳ තොරතුරු හා නිර්දේශය පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් **දී ඇති ආකෘතිවලට අනුව ම** (ජාතික ගණිත දැනුම මිනුම තරගාවලිය සඳහා ආකෘති අංක 1 සහ ජාතික ගණිත නාට්‍ය තරගාවලිය සඳහා ආකෘති අංක 2) සම්පූර්ණ කර නියම කර ඇති අවසන් දිනට පෙර අධ්‍යාපන ලේකම් මගින්, අතිරේක ලේකම් (අධ්‍යාපන ගුණාත්මක සංවර්ධන) මගින්, අධ්‍යාපන අධ්‍යක්ෂ, ගණිත ශාඛාව, අධ්‍යාපන අමාත්‍යාංශය, ඉසුරුපාය, බත්තරමුල්ල යන ලිපිනය වෙත ද එවිය යුතු ය. එසේ නිවැරදි ව නියමිත දිනයට පෙර අදාළ තොරතුරු නොඑවන තරග කණ්ඩායම්වලට ජාතික ගණිත තරගාවලියට ඉදිරිපත්වීමට අවස්ථාව දෙනු නොලැබේ.

3 පිටුවට

## 2 .2 ජාතික ගණිත දැනුම මිනුම තරගාවලිය

### 2.2.1 ජාතික ගණිත දැනුම මිනුම තරගාවලියේ සුවිශේෂී අරමුණු

1. සුහග සිසුන් හඳුනාගෙන ජාත්‍යන්තර සමාජයේ ගණිත ක්ෂේත්‍රයෙහි ගෞරවනීය ස්ථානයක් ඇතිකර ගැනීමේ ශක්‍යතා ඔවුන් තුළ වර්ධනය කිරීම.
2. ගණිත විෂයය දැනුම සම්බන්ධව ගුරු සිසු දෙපිරිසගේ ම බුද්ධි කලම්බන අවස්ථා ඇති කිරීම.
3. සිසුන් තුළ ඇති ගණිත විෂයයට අදාළ විභව්‍යතා එළිදැක්වීමට සහ ඇගයීමට ලක්කිරීමට අවකාශ සැලසීම.

### 2.2.2 ජාතික ගණිත දැනුම මිනුම තරගාවලියේ තරග කොන්දේසි

#### 2.2.2.1 තරග ඉසව්

කණිෂ්ඨ අංශය හා ජ්‍යෙෂ්ඨ අංශය වශයෙන් වෙන වෙනම තරග ඉසව් දෙකක් පැවැත්වේ. නමුත් සිංහල හා දෙමළ මාධ්‍ය වශයෙන් ඉසව් වෙන් නොකෙරෙන අතර කිසියම් ඉසව්වක් නියෝජනය කිරීමට මාධ්‍ය දෙකෙහි ම ශිෂ්‍යයන්ට අවකාශ ඇත.

#### 2.2.2.2 සහභාගිත්වය

| තරග අංශය | තරගයට ඉදිරිපත්වන කණ්ඩායමට අයත් සිසුන් ගණන | සිසුන් අයත් ශ්‍රේණි | එක් එක් ශ්‍රේණියෙන් කණ්ඩායමට අයත් සිසුන් ගණන | තරගයට ඉදිරිපත්වන කණ්ඩායමට අමතරව **අතිරේක සිසුන් ගණන** |
|---|---|---|---|---|
| කණිෂ්ඨ | 6 | 6 | 2 | 1 |
| | | 7 | 2 | 1 |
| | | 8 | 2 | 1 |
| ජ්‍යෙෂ්ඨ | 6 | 9 | 3 | 1 |
| | | 10 | 3 | 1 |

වගු අංක 1 - එක් එක් ශ්‍රේණි යටතේ ගණිත දැනුම මිනුම තරග ඉසව් සඳහා සිසු සහභාගිත්වය

- කලාප මට්ටමේ ගණිත දැනුම මිනුම තරගාවලිය සඳහා පාසල් නියෝජනය කරමින් කණ්ඩායම් ඉදිරිපත් වුව ද පළාත් මට්ටමේ ගණිත දැනුම මිනුම තරගාවලිය සඳහා එක් පාසලකට සීමා නොවී කලාපය නියෝජනය කරන කණ්ඩායමක් වශයෙන් තරගයට ඉදිරිපත් විය හැකි ය. එලෙස ම ජාතික මට්ටමේ දැනුම මිනුම තරගාවලිය සඳහා යම් පාසලකට හෝ කලාපයකට සීමා නොවී පළාත නියෝජනය කරන කණ්ඩායමක් වශයෙන් ඉහළ ලකුණු ලද ශිෂ්‍යයන්ගෙන් සැදුම්ලත් කණ්ඩායමක් තරගයට ඉදිරිපත් කරවිය හැකි ය.

- කිසියම් කණ්ඩායමකට අයත් සිසුවෙකුට විනිශ්චය මණ්ඩලය විසින් පිළිගනු ලබන හේතුවක් මත තරගයට සහභාගි විය නොහැකි අවස්ථාවක දී ආදේශනය පිණිස අතිරේක සිසුන් සූදානම්ව තබාගත යුතු ය.

- සියලුම ළමුන් අදාළ වර්ෂයේ දී වගු අංක 01 පරිදි නියමිත ශ්‍රේණියේ ඉගෙනුම ලබන්නන් බවට අදාළ විදුහල්පතිගෙන් සහතිකයක් පළාත් සම්බන්ධීකරණ නිලධාරී මගින් විනිශ්චය මණ්ඩලය වෙත ජාතික තරගය ආරම්භවීමට පෙර ඉදිරිපත් කළ යුතු ය.

#### 2.2.2.3 තරග පැවැත්වීමේ ක්‍රමවේදයට අදාළ කොන්දේසි

- පළමු අදියරට කණ්ඩායම් 8 ක් තෝරාගැනීම සඳහා එකිනෙකට වෙනස් ස්ථානයන්හි දී එකම විට එක හා සමාන ගණිත දැනුම මිනුම ප්‍රශ්නාවලියක් බැගින් එක් එක් පළාතෙන් පැමිණෙන කණ්ඩායම් වෙත යොමුකර වාචික පිළිතුරු විනිශ්චය මණ්ඩලය විසින් ඇගයීමට ලක්කරනු ලැබේ. මෙම තේරීම් පරීක්ෂණයේ දී ප්‍රශ්න තෝරාගැනීමට අවකාශ නොමැති අතර පිළිතුරු දීම සඳහා මිනිත්තුවක කාලයක් ලබාදේ. <u>පිළිතුරු දීමට නොහැකි වන ප්‍රශ්න වෙනත් අයෙකුට යොමු නොකෙරේ.</u> අඩු ම ලකුණු ලබාගන්නා කණ්ඩායම තරගාවලියෙන් ඉවත් කෙරේ. ( මෙම තේරීම් තරගයේ ලකුණු අවසාන තරගයට අදාළ නොවේ.)

4 පිටුවට

- ඉතිරිවන කණ්ඩායම් අට අවරෝහණ ලකුණු පෙළ ගැස්වීමට අනුව 1 සිට 8 දක්වා ස්ථාන අංක කර (1,5) ; (2,6) ; (3,7) සහ (4,8) වශයෙන් කණ්ඩායම් යුගල් කිරීමෙන් පළමුවන තරග අදියර එකම වේලාවක ස්ථාන හතරක දී පැවැත්වේ. පළමුවන තරග අදියරේ දී පරාජය වන කණ්ඩායම් තරගාවලියෙන් ඉවත් කෙරෙන අතර, ජයග්‍රහණය කරන කණ්ඩායම් අවරෝහණ ලකුණු පෙළ ගැස්වීමට අනුකූලව 1 සිට 4 දක්වා ස්ථාන අංක කර (1,3) සහ (2,4) වශයෙන් නැවත යුගල් කිරීමෙන් දෙවන තරග අදියර එකම වේලාවක ස්ථාන දෙකක දී පැවැත්වේ..

- දෙවන තරග අදියරේ ජයග්‍රහණය කරන කණ්ඩායම් දෙක සහ පරාජය වන කණ්ඩායම් දෙක අතර සිදුකෙරෙන තෙවන තරග අදියරේ තරග එකම වේලාවක ස්ථාන දෙකක දී පැවැත්වේ. එහි දී දෙවන අදියරේ ජයග්‍රාහී කණ්ඩායම් දෙක අතර තරගයෙන් ජයග්‍රාහී කණ්ඩායම පළමු ස්ථානය ලෙස ද, පරාජය වන කණ්ඩායම දෙවන ස්ථානය ලෙස ද තෝරා ගැනේ. දෙවන තරග අදියරේ දී පරාජය වූ කණ්ඩායම් දෙක අතර තරගයෙන් ජයග්‍රහණය කරන කණ්ඩායමට තරගාවලියේ තෙවන ස්ථානය හිමි වේ.

- තරගය සඳහා කණ්ඩායමේ ළමුන් පහළ ශ්‍රේණියේ සිට ඉහළ ශ්‍රේණියට සිටින ආකාරයට අසුන්ගන්වනු ලැබේ.

- එක් තරග අදියරක දී එක් එක් ශ්‍රේණියකට ගැළපෙන ආකාරයට එක් වටයකට එක් පිළකට ප්‍රශ්න 6ක් බැගින් ඉදිරිපත් කෙරනු ඇත. (එලෙස වට දෙකක් පැවැත්වේ.)

- තරගය ආරම්භයේ දී ම ප්‍රශ්න තෝරාගැනීම කුසපත් ඇදීමෙන් සිදුකරනු ලැබේ.

- මුලින් ම ප්‍රශ්නය යොමු කරන කණ්ඩායම කාසියේ වාසිය උරගා බැලීමෙන් තීරණය කෙරෙන අතර දෙවන වටයේ දී අනෙක් පිළට මුල් වාරය හිමිවේ.

- අදාළ තරගකරුවන්ට ප්‍රශ්න ඉදිරිපත් කරනුයේ පහළ ශ්‍රේණියේ සිට ඉහළ ශ්‍රේණිය දක්වා පිළිවෙලට ය.

- එක් ප්‍රශ්නයක් එක් මාධ්‍යකින් උපරිමව දෙවරක් පමණක් කියවනු ලැබේ. (අවශ්‍යතාවය අනුව ප්‍රශ්න මාධ්‍ය දෙකෙන් ම (සිංහල/දෙමළ) ඉදිරිපත් කෙරේ.)

- අදාළ තරගකරුට පිළිතුරු දීම සඳහා කාලය තත්පර 60ක් තුළ උත්සාහයන් දෙකකට අවසර ඇත. නිවැරදි පිළිතුරට ලකුණු 10 ක් ලැබේ. පිළිතුර වැරදි නම් එම පිළේ ම අදාළ ශ්‍රේණියේ වෙනත් අයෙකුට යොමු කෙරේ. කාලය තත්පර 15 කි. එක් උත්සාහයකට පමණක් අවසර ලැබේ. පිළිතුර නිවැරදි නම් ලකුණු 5ක් හිමි වේ.

- එම පිළිතුර ද වැරදි නම් ප්‍රශ්නය ප්‍රතිවිරුද්ධ පිළට යොමු **කෙරේ.** කාලය තත්පර 15 කි. එක් උත්සාහයක දී පිළිතුර නිවැරදි නම් ලකුණු 5ක් හිමි වේ.

- පහළ ශ්‍රේණියේ තරගකරුවෙකුට යොමු කරන ප්‍රශ්නයක් සඳහා කිසිදු විටෙක ඉහළ ශ්‍රේණියේ තරගකරුවෙකුගේ පිළිතුර පිළිනොගැනේ. ඉහළ ශ්‍රේණියේ තරගකරුවෙකුගේ ප්‍රශ්නයකට පහළ ශ්‍රේණියේ තරගකරුවෙකුගේ පිළිතුර පිළිගැනේ.

- වට දෙක අවසානයේ කණ්ඩායම් දෙක ම සම ලකුණු ලබා ඇත්නම් දිනුම ලබා දීම සඳහා වරකට ප්‍රශ්න යුගලය බැගින් අවම ප්‍රශ්න යුගල සංඛ්‍යාවක් ඉහළම ශ්‍රේණියේ තරග කරුවන්ට ඉදිරිපත් කෙරේ.

- විනිශ්චය මණ්ඩලය තිදෙනෙකුගෙන් සමන්විත විය යුතු අතර ඔවුන් ගණිත විෂයය ක්ෂේත්‍රයේ ප්‍රවීණයන් මෙන් ම දැනට රජයේ සේවයේ නියුතු නිලධාරීන් හෝ විශ්‍රාමික රජයේ නිලධාරීන් විය යුතු ය.

### 2.2.3 ජාතික ගණිත දැනුම මිනුම තරගාවලියේ තරග කාලසටහන

පහත සඳහන් කාල පරාසයන් නොඉක්මවන පරිදි අදාළ තරග පවත්වා නිම කළ යුතු ය.

| තරගාවලිය | කලාප මට්ටම | පළාත් මට්ටම | ජාතික මට්ටම |
|---|---|---|---|
| ගණිතය දැනුම මිනුම | මැයි/ජුනි | ජුනි/ජූලි | සැප්තැම්බර් |

වගු අංක 2 - ජාතික ගණිත දැනුම මිනුම තරගාවලි පැවැත්වෙන කාල පරාසය

### 2.2.4 ජාතික ගණිත දැනුම මිනුම තරගාවලියේ ජයග්‍රාහී කණ්ඩායම් සඳහා ප්‍රදානයන්

- පළමු, දෙවන, තෙවන ස්ථාන ලබාගන්නා කණ්ඩායම්වල සියලු තරගකරුවන් සඳහා සහතික පත්‍රය බැගින් ද, කණ්ඩායමට අදාළ ජයග්‍රහණ සංකේතවත් කෙරෙන පදක්කම බැගින් ද ප්‍රදානය කරනු ලැබේ.

- පළමු, දෙවන, තෙවන ස්ථාන ලබාගත් කණ්ඩායම්වල තරගයට සහභාගී නොවූ අතිරේක තරගකරුවන්ට සහ ජාතික තරගාවලිය සඳහා සහභාගී වූ සෙසු කණ්ඩායම් නියෝජනය කළ තරගකරුවන්ට සහභාගීත්ව සහතිකයක් පමණක් පිරිනැමේ.

5 පිටුවට

## 2.3 ජාතික ගණිත නාට්‍ය තරගාවලිය

### 2.3.1 ජාතික ගණිත නාට්‍ය තරගාවලියේ සුවිශේෂී අරමුණු

1. ගණිත සංකල්ප හා තේමා පාදක කර ගනිමින් ගණිතය ප්‍රාසාංගිකව ඉදිරිපත් කිරීමට පෙළඹවීම.
2. නැවත නැවත භාවිතය සහ ප්‍රාසාංගිකව ඉදිරිපත් කිරීම මගින් අසීරු ගණිත සංකල්ප පහසුවෙන් තහවුරු කිරීමේ නව ක්‍රමවේදයන් හඳුන්වා දීම.
3. නිදහස් සෞන්දර්යාත්මක පසුබිමක් තුළ රසවත්ව, විනෝදජනකව, සාමූහිකව ගණිතය ඉගෙනීමට සිසුන් පෙළඹවීම.
4. ගුරු භවතුන් හා සිසුන් නිර්මාණකරනයට පොළඹවමින් ඔවුන්ගේ ගණිත නිර්මාණ කුසලතා වර්ධනය සහ ප්‍රතිභා ශක්තිය උද්දීපනය කිරීම.
5. ගණිත සංකල්ප සිසුන් තුළ තහවුරු කරවීමට විවිධ නිර්මාණාත්මක විකල්ප ක්‍රම අත්හදා බැලීමට ගුරුවරුන් පෙළඹවීම.

### 2.3.2 ජාතික ගණිත නාට්‍ය තරගාවලියේ තරග කොන්දේසි

#### 2.3.2.1 තරග ඉසව්

**කණිෂ්ඨ** අංශය සහ **ජ්‍යෙෂ්ඨ** අංශය වශයෙන් වෙන වෙන ම ද, **සිංහල මාධ්‍ය** සහ දෙමළ මාධ්‍ය වශයෙන් වෙන වෙන ම ද වන සේ ඉසව් 4ක් යටතේ තරග පැවැත්වේ.

#### 2.3.2.2 සහභාගිත්වය

| තරග අංශය / මාධ්‍යය | **කණිෂ්ඨ අංශය සඳහා ඇතුළත් ශ්‍රේණි** | **ජ්‍යෙෂ්ඨ අංශය සඳහා ඇතුළත් ශ්‍රේණි** |
|---|---|---|
| ගණිත නාට්‍ය සිංහල මාධ්‍ය | 6, 7, 8, 9 | 6 සිට 13 දක්වා |
| ගණිත නාට්‍ය දෙමළ මාධ්‍ය | 6, 7, 8, 9 | 6 සිට 13 දක්වා |

වගු අංක 3 - එක් එක් ශ්‍රේණි යටතේ ගණිත නාට්‍ය තරග ඉසව් සඳහා සිසු සහභාගිත්වය

- නාට්‍ය රංගනයට එක් ඉසව්වක් සඳහා සහභාගි විය යුතු සාමාජිකයින් උපරිම සංඛ්‍යාව 15 විය යුතු ය. ඒ සඳහා වගු අංක 3 පරිදි පාසල් දරුවන් පමණක් තෝරාගත යුතු ය.

- රංගනයට අමතරව පසුබිම් ගායනය, වාදනය සපයන්නේ නම් ඒ සඳහා අමතර සාමාජිකයින් උපරිම 10ක් සහභාගි කළ හැකි ය. එනම් රංගනයට හැර ආනුශංගික (පසුබිම් ගායනය හා වාදනය...) අංග සඳහා සහභාගි වීමේ දී කණිෂ්ඨ ජ්‍යෙෂ්ඨ සීමාව නොතකා 6-13 ශ්‍රේණිවල සිසු දරුවන්ගේ සහ ඊට අමතරව එම පාසලෙහි ගුරු භවතුන්ගේ සහභාගිත්වය ලබා ගත හැකි ය. ආනුශංගික අංග සඳහා තම අධ්‍යාපන කලාපය තුළ පිහිටි රජයේ වෙනත් පාසල්වල ගුරුභවතුන්ගේ සහභාගිත්වය ද ලබාගත හැකි ය.

- ජාතික මට්ටම දක්වා සියලුම අදියරයන්හි දී ඉදිරිපත්වන සෑම කණ්ඩායමක් ම **කිසියම් පාසලක් නියෝජනය කරන කණ්ඩායමක් ලෙස** තරගයට ඉදිරිපත් විය යුතු ය.

- කණ්ඩායම සඳහා සහභාගි වන සෑම සිසු සිසුවියක් ම පාසලේ අදාළ ශ්‍රේණියෙහි ඉගෙනුම ලබන බවට විදුහල්පතිගේ සහතිකයක් පළාත් සම්බන්ධීකරණ නිලධාරී මගින් විනිශ්චය මණ්ඩලය වෙත ජාතික තරග ආරම්භවීමට පෙර ඉදිරිපත් කළ යුතු ය.

#### 2.3.2.3 තරග පැවැත්වීමේ ක්‍රමවේදයට අදාළ කොන්දේසි

- නාට්‍ය රඟ දක්වන සම්පූර්ණ කාලය මිනිත්තු 20ට වඩා නොවැඩි විය යුතු අතර මිනිත්තු 15කට වඩා නොඅඩු විය යුතු ය.

- නාට්‍යයේ මූලික හරය ගණිත විෂයයට අදාළ සංකල්පයක් ඔස්සේ ගොඩනැගී තිබිය යුතු ය.

- කිසියම් කලාපයක් නියෝජනය කිරීමට සිංහල හෝ දෙමළ මාධ්‍යයකින් එකකට වඩා ඉදිරිපත් නොවන අවස්ථාවල දී ඉදිරිපත් වන කණ්ඩායම නිතරගයෙන් පළාත් මට්ටමේ තරගය සඳහා ඉදිරිපත් විය හැකි ය.

6 පිටුවට

- විනිශ්චය මණ්ඩලය තිදෙනෙකුගෙන් සමන්විත විය යුතු අතර එය අවම වශයෙන් ගණිතය විෂයය පිළිබඳව ප්‍රවීණයන් දෙදෙනෙකු හා නාට්‍ය කලාව පිළිබඳ ප්‍රවීණයෙකුගෙන් සමන්විත විය යුතු වේ. ඔවුන් දැනට රජයේ සේවයේ නියුතු නිලධාරින් හෝ විශ්‍රාමික රජයේ නිලධාරින් විය යුතු ය.

- සියලුම තරග ඉසව්වල දී සිසු සිසුවියන් සැරසී සිටින ඇඳුම් පැළඳුම්, පාසල් පද්ධතියට සහ දේශීය හර පද්ධතීන්ට ගැළපෙන අයුරින් සකස් විය යුතු ය. ඒවා එම සිසු සිසුවියන්ගේ ආත්ම ගෞරවය සුරැකෙන, විශේෂයෙන් ම ශිෂ්‍යාවන්ගේ ශික්ෂණයට ගැළපෙන හා රංගන ශෛලීන්ට ගැළපෙන ඒවා විය යුතු ය. අනවශ්‍ය ආකාරයෙන් අඟ පසඟ නිරාවරණය නොවන ලෙසට ඒවා නිර්මාණය වී තිබිය යුතු ය. කිසිදු ආගමකට, ජාතියකට, පුද්ගලයෙකුට අපහාසයක්, අපහසුතාවයක් නොවන අයුරින් සදාචාරයට පටහැනි නොවන ඇඳුම්, දෙබස් නිර්මාණය විය යුතු ය. එසේ නොවුවහොත් එම කණ්ඩායම තරගයෙන් ඉවත් කිරීමට හේතුවක් වනු ඇත. ඉහත කරුණු පිළිබඳ පූර්ණ වගකීම අදාළ විදුහලේ විදුහල්පති විසින් දැරිය යුතු වේ.

### 2.3.3 ජාතික ගණිත නාට්‍ය තරගාවලියේ ඇගයීම

පහත නිර්ණායක යටතේ නාට්‍ය නිර්මාණ ඇගයීමට ලක්කෙරෙනු ඇත.

| | | |
|---|---|---|
| ➢ නාට්‍ය නිර්මාණය තුළ ගණිතමය සංකල්පයක් නිවැරදිව ඉදිරිපත් කිරීම. | - | (ලකුණු 15) |
| ➢ එම ගණිතමය සංකල්පය නිර්මාණාත්මකව නිරූපණය කිරීම. | - | (ලකුණු 25) |
| ➢ රංගනයෙහි ප්‍රමිතිය ඉහළ මට්ටමින් පවත්වාගෙන යාම | - | (ලකුණු 20) |
| ➢ අනෙකුත් ආනුශංගික අංග නාට්‍යයේ සාර්ථකත්වයට දායකවීම | - | (ලකුණු 20) |
| ➢ නාට්‍යයේ සමස්ත ඒකාබද්ධතාවය හා තරග කොන්දේසිවලට අනුකූල වීම. | - | (ලකුණු 20) |
| **එකතුව** | - | ලකුණු 100 |

### 2.3.4 ජාතික ගණිත නාට්‍ය තරගාවලියේ තරග කාලසටහන

| තරගාවලිය | කලාප මට්ටම | පළාත් මට්ටම | ජාතික මට්ටම |
|---|---|---|---|
| ගණිත නාට්‍ය සිංහල මාධ්‍ය<br>ගණිත නාට්‍ය දෙමළ මාධ්‍ය | මැයි/ ජූනි | ජූනි/ජූලි | ඔක්තෝබර් |

**වගු අංක 4 -** ජාතික ගණිත නාට්‍ය තරගාවලි පැවැත්වෙන කාල පරාසය

### 2.3.4 ජාතික ගණිත නාට්‍ය තරගාවලියේ ජයග්‍රාහී කණ්ඩායම් සඳහා ප්‍රදානයන්

- පළමු, දෙවන, තෙවන ස්ථාන ලබාගත් කණ්ඩායම්වල රංගනයට සහ ආනුශංගික අංග සඳහා සහභාගි වූ සියලු සාමාජිකයින් සඳහා සහතික පත්‍රය බැගින් ද කණ්ඩායම සඳහා අදාළ ජයග්‍රහණය සංකේතවත් කෙරෙන කුසලානය බැගින් ද ප්‍රදානය කරනු ලැබේ.

- ජාතික තරගාවලිය සඳහා සහභාගි වූ සෙසු කණ්ඩායම්වල සියලු සාමාජිකයින් සඳහා සහභාගිත්ව සහතිකයක් පමණක් හිමිවේ.

## 3.0 ජාතික ගණිත තරගාවලිය සඳහා ආහාර පාන සහ නවාතැන් පහසුකම්

ජාතික මට්ටමේ තරග පැවැත්වෙන දිනයන්හි දී තරගය සඳහා සහභාගි වන කණ්ඩායම්වල සාමාජිකයින් සහ ඔවුන් භාරව පැමිණෙන ගුරුභවතුන් සහ නිලධාරින් සඳහා ආහාර පාන සහ නවාතැන් පහසුකම් පමණක් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් සපයනු ලැබේ.

## 4.0 ප්‍රතිපාදන

කලාප මට්ටමින් සහ පළාත් මට්ටමින් තරග සංවිධානය හා පැවැත්වීමත් ජාතික මට්ටමේ තරගය සඳහා කණ්ඩායම් ඉදිරිපත් කිරීමත් සඳහා අවශ්‍ය ප්‍රතිපාදන පළාතේ විෂයය සංවර්ධනය සඳහා වෙන් ව ඇති ප්‍රතිපාදනවලින් සලසාගත යුතු ය.

මෙම තරග පැවැත්වීමේ ප්‍රධාන අරමුණ වන්නේ ගණිත විෂයය ප්‍රියජනක විෂයයක් බවට පත් කර සිසුන්ගේ ගණිතය සාධන මට්ටම ඉහළ නැංවීම වන බැවින් පළාතේ විෂයය සංවර්ධන ඉලක්කවලට අනුකූල වන පරිදි සැලසුම් සහගතව සහ මනා නියාමනයකින් යුතුව මෙම තරගාවලිය සාර්ථක කර ගැනීම සඳහා පළාත් අධ්‍යාපන ලේකම්ගේ සහ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂගේ පූර්ණ අනුග්‍රහය අවශ්‍ය පරිදි ලබා දිය යුතු වේ.

7 පිටුවට

44

**5.0** මෙම තරග සඳහා ඉදිරිපත් වන සියලුම තරගකරුවන් සහ ඔවුන් සමඟ සම්බන්ධවන අනෙකුත් පාර්ශවකරුවන්තරගාවලියේ සෑම අවස්ථාවක දී ම මෙම චක්‍රලේඛනයේ සඳහන් කොන්දේසිවලට යටත්ව කටයුතු කිරීමටත්, විනිශ්චය මණ්ඩලයේ තීරණය අවසාන තීරණය වශයෙන් පිළිගැනීමටත් එකඟ විය යුතු ය.

මෙම චක්‍ර ලේඛයෙහි දක්වා ඇති වගන්ති හා සීමාවන් එකකට හෝ කිහිපයකට හෝ පටහැනිව කටයුතු කොට ඇති බව අනාවරණය වුවහොත් තරගයේ කුමන අවස්ථාවක දී වුව ද ප්‍රතිඵල ලේඛනවලින් එම කණ්ඩායම ඉවත් කිරීම, විනයානුකූල පියවර ගැනීම ඇතුළු අදාළ වෙනත් තීරණ ගැනීම අධ්‍යාපන අමාත්‍යාංශය සතු වේ.

එස්. එම්. ගෝඨාභය ජයරත්න
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය.
2013. 05. [illegible]

එම්. ගෝඨාභය ජයරත්න
ලේකම්
අධ්‍යාපන [illegible]
"ඉසුරුපාය"
බත්තරමුල්ල

# ජාතික ගණිත තරගාවලිය

## ජාතික ගණිත දැනුම මිනුම තරගාවලිය - 20……

(පළාත නියෝජනය කරන කණ්ඩායම පිළිබඳ තොරතුරු)

1. පළාත -
2. 

2.1 කණිෂ්ඨ අංශය (6,7,8 ශ්‍රේණි)
(සහතික පත්‍රයේ ලිවිය යුතු ආකාරය සම්පූර්ණ නම සහ පාසල නිවැරදිව සඳහන් කරන්න.)

| ශ්‍රේණි | ශිෂ්‍යයාගේ නම | පාසල | අධ්‍යාපන කලාපය |
|---|---|---|---|
| 6 | | | |
| | | | |
| 7 | | | |
| | | | |
| 8 | | | |
| | | | |
| අතිරේක තරගකරුවන් | | | |
| 6 | | | |
| 7 | | | |
| 8 | | | |

2.2 ජ්‍යෙෂ්ඨ අංශය (9,10 ශ්‍රේණි)

| ශ්‍රේණි | ශිෂ්‍යයාගේ නම | පාසල | අධ්‍යාපන කලාපය |
|---|---|---|---|
| 9 | | | |
| | | | |
| | | | |
| 10 | | | |
| | | | |
| | | | |
| අතිරේක තරගකරුවන් | | | |
| 9 | | | |
| 10 | | | |

ඉහත සඳහන් තොරතුරු සත්‍ය හා නිවැරදි බවට සහතික කරමි.

……………………………… ……………………………

පළාත් ගණිත විෂය සම්බන්ධීකරණ නිලධාරී          දිනය

- **පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂගේ නිර්දේශය**

පළාත් ගණිත විෂය සම්බන්ධීකරණ නිලධාරී විසින් ඉදිරිපත් කර ඇති උක්ත තොරතුරුවලට අදාළ කණ්ඩායම ජාතික තරගාවලිය සඳහා ඉදිරිපත් කිරීමට උචිත බව නිර්දේශ කරමි.

……………………………… ……………………………

පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ          දිනය

**කණිෂ්ඨ අංශය සහ ජ්‍යෙෂ්ඨ අංශය වශයෙන් ද, සිංහල සහ දෙමළ මාධ්‍ය වශයෙන් වෙන් වෙන් ව මෙම ආකෘති පත්‍ර ඉදිරිපත් කළ යුතු ය.**

| | |
|---|---|
| **කණිෂ්ඨ අංශය (සිංහල)** | |
| **කණිෂ්ඨ අංශය (දෙමළ)** | |
| **ජ්‍යෙෂ්ඨ අංශය (සිංහල)** | |
| **ජ්‍යෙෂ්ඨ අංශය (දෙමළ)** | |

අදාළ කොටුවේ ✓ යොදන්න

## ජාතික ගණිත තරගාවලිය
## ජාතික ගණිත නාට්‍ය තරගාවලිය - 20…….

(පළාත නියෝජනය කරන කණ්ඩායම පිළිබඳ තොරතුරු)

1. පළාත - 1.1. කලාපය -
2. පාසල -
3. නාට්‍යයේ නම - 3.1. මාධ්‍ය -
4. තරග අංශය -
5. සහභාගී වන කණ්ඩායම -

5.1

| | | **ශිෂ්‍යා/ශිෂ්‍යාවගේ නම** | **ශ්‍රේණිය** |
|---|---|---|---|
| **නාට්‍ය රංගන කණ්ඩායම** | 1 | | |
| | 2 | | |
| | 3 | | |
| | 4 | | |
| **(සම්පූර්ණ නම පැහැදිලිව සටහන් කරන්න.)** | 5 | | |
| | 6 | | |
| | 7 | | |
| | 8 | | |
| | 9 | | |
| **රංගනයට සහභාගිවන්නන් පමණි** | 10 | | |
| | 11 | | |
| | 12 | | |
| | 13 | | |
| | 14 | | |
| | 15 | | |

5.2

| | | **සහභාගිවන්නන්ගේ නම** | **තනතුර (ශිෂ්‍ය/ගුරු ආදි වශයෙන්)** | **ශිෂ්‍යයෙක් නම් ශ්‍රේණිය** |
|---|---|---|---|---|
| **රංගන අවස්ථාවට සහභාගී නොවන පසුබිම් ගායන හා වාදන කණ්ඩායම** | 1 | | | |
| | 2 | | | |
| | 3 | | | |
| | 4 | | | |
| | 5 | | | |
| | 6 | | | |
| | 7 | | | |
| | 8 | | | |
| | 9 | | | |
| | 10 | | | |

2 පිටුවට

6. නාට්‍ය නිරූපණය පිළිබඳ තොරතුරු

   i. අධ්‍යක්ෂණය -
   ii. අත්පිටපත් රචනය -
   iii. සංගීතය -
   iv. පසුතල නිර්මාණය -
   v. ඇඳුම් නිර්මාණය -

7. මේ සමඟ නාට්‍ය අත්පිටපත ඉදිරිපත් කර ඇත් ද යන බව - ඇත / නැත
(අනිවාර්යයෙන් ම ඉදිරිපත් කළ යුතු ය.)

ඉහත සඳහන් තොරතුරු සත්‍ය හා නිවැරදි බව සහතික කරන අතර පළාත් තරගය මගින් තෝරාගන්නා ලද ජාතික තරගයට ඉදිරිපත් කිරීමට නියමිත නාට්‍යයේ අත්පිටපත මේ සමඟ ඉදිරිපත් කර ඇති බව ද සහතික කරමි.

...................................... ..............................

පළාත් ගණිත විෂය සම්බන්ධීකරණ නිලධාරී දිනය

- **පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂගේ සහතිකය**

පළාත් ගණිත විෂය සම්බන්ධීකරණ නිලධාරී විසින් ඉදිරිපත් කර ඇති උක්ත තොරතුරුවලට අනුව පළාතේ, (අනවශ්‍ය වචන කපාහරින්න) කණිෂ්ඨ සිංහල/ කණිෂ්ඨ දෙමළ / ජ්‍යෙෂ්ඨ සිංහල /ජ්‍යෙෂ්ඨ දෙමළ අංශය සඳහා ප්‍රථම ස්ථානය දිනූ මේ සමඟ ඇති නාට්‍ය අත්පිටපතට අයත් නාට්‍ය ජාතික තරගාවලිය සඳහා ඉදිරිපත් කිරීමට උචිත බව නිර්දේශ කරමි.

........................................ ................................

පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ දිනය